# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 989/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 12/06/2024<br>පැය 1715 |

## මාධ්‍ය නිවේදනය

**මාරක රිය අනතුරක් - බිබිල පොලිස් වසම.**

2024.06.12 වන දින සවස් කාලයේ බිබිල පොලිස් වසමේ බිබිල මහියංගනය ප්‍රධාන මාර්ගයේ වැගම ප්‍රදේශයේදී බිබිල දෙස සිට කොටගම දෙසට ධාවනය වූ මඟී ප්‍රවාහන පුද්ගලික බස් රථයක නඩත්තු කටයුත්තක් සඳහා ගරාජයක් ඉදිරිපිට නවතා තිබියදී ඊට ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි වෑන් රථයක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් වෑන් රථයේ ගමන් කළ කාන්තාවන් දෙදෙනෙක් හා පිරිමි පුද්ගලයෙක් මියගොස් ඇති අතර වෑන් රථයේ රියදුරු ඇතුළුව පුද්ගලයින් 05 දෙනෙකු තුවාල ලබා බිබිල රෝහලට ඇතුලත් කර ඇත.

**මරණකරුගේ වයස අවුරුදු 73ක් වන අතර, එක් මරණකාරියකගේ වයස අවුරුදු 69 ක්ද අනෙක් මරණකාරියගේ වයස අවුරුදු 73 ක් වන වැගම, බිබිල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෘත ශරීර බිබිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට අදාල බස් රථයේ රියදුරු හා කොන්දොස්තර අත්අඩංගුවට ගෙන ඇත. බිබිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.